සමේ වර්ණය පදනම් කරගනිමින් විදේශිකයින්ව "සුද්දා", "සුද්දි" වැනි යෙදුම් ඔස්සේ හැඳින්වීම ශ්‍රී ලංකාවේ සමාජය තුළත්, මාධ්‍ය තුළත් තවමත් දැකිය හැක. එසේ වුවත්, කුමන පසුබිමක් තුළ "සුද්දා" හෝ "සුද්දි" වැනි යෙදුමක් භාවිතා වූවත්, එය සමේ වර්ණය මත පදනම් වෙමින් විදේශිකයින්ව කොන් කිරීම් ප්‍රවර්ධනයට හේතුවක් නොවේදැයි පාඨක අප විමසිය යුතු වේ.
ඊට නිදසුනක් ලෙසට, අරුණ කතුවැකිය (මැයි 11, 2023) දැක්විය හැක.
"සුද්දන්ට එන්න කියමු - බේරිලා යන්න කියමු" යන සිරස්තලයෙන් යුතු මෙම කතුවැකිය තුළ, "සුද්දෙක්", "සුද්දන්", "සුද්දා" වැනි යෙදුම් ඔස්සේ තැන් ගණනාවකම විදේශිකයින්ව හඳුන්වා තිබිණි.
කෙසේ නමුත්, "විදෙස් කතුන්", "විදේශීය සංචාරකයන්" වැනි යෙදුම් ද තැන් කිහිපයක සඳහන්ව තිබිණි.
1) මෙම කතුවැකියේ "සුද්දා", "සුද්දන්" වැනි යෙදුම් වෙනුවට, එම කතුවැකියේ අන්තර්ගතයන් තුළ වඩාත් නිවැරදිව දැක්වෙන "විදේශික සංචාරකයන්" යන්න වඩාත් උචිත නොවන්නේ ද?
2) විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ඔස්සේ සැලකිය යුතු ආදායමක් ලබා ගන්නා ශ්‍රී ලංකාව වැනි රටක, මාධ්‍ය තුළ මෙවැනි විදේශිකයින් සම්බන්ධයෙන් කොන් කිරීමක් ජනිත කරවන සුළු යෙදුම් භාවිතය කෙතරම් යෝග්‍ය ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

